සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙන් මාකාණක් කල්විත් තිණෙක්කලම් තෙන් මාකාණක් කල්විත් තිණෙක්කලම්
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Education, Southern Province Department of Education, Southern Province
දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙන් මාකාණක් කල්විත් තිණෙක්කලම් තෙන් මාකාණක් කල්විත් තිණෙක්කලම්
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Education, Southern Province Department of Education, Southern Province

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	පෙරදිග සංගීතය - I	කාලය / நேரம் / Time	පැය 1 යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- **1- 40 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**
- **1.සිට 5 දක්වා ප්‍රශ්න වලට පහත කොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.**

A කල්‍යාණ මේලයෙන් උපදී
B දිවා ප්‍රථම ප්‍රහරයේ ගැයේ
C සඩ්ජය සංවාදී ලෙස යෙදේ
D ශුද්ධ ස්වර පමණක් යෙදේ
E ස රි ප අනුවාදී ස්වර ලෙස යෙදේ

01. ඉහත තොරතුරු වලට අනුව බිලාවල් හා භූපාලි රාගයට පමණක් සත්‍ය වන කරුණ වන්නේ,
1. A 2. B 3. D 4. E

02. නිර්දේශිත ඖඩව ජාති රාගයට අයත් ලක්ෂණ දෙකකි.
1. B , C 2. A , C 3. D , C 4. A , E

03. විවාදී ස්වර 5ක් යොදා ගත හැකි නිර්දේශිත රාගයට අයත් කරුණු දක්වා ඇති අක්ෂර වනුයේ
1. B ,C 2. A ,B 3. B , E 4. C , E

04. යමන් රාගයට අදාල තොරතුර ඇතුළත් අක්ෂරය වන්නේ,
1. A 2. B 3. C 4. E

05. බිලාවල් හා හෙරවී රාග දෙකටම පොදු කරුණක් වන්නේ,
1. A 2. B 3. C 4. D

06. කාෆි රාගයට අයත් ස්වර සමූහයකි.
1. මගමරි 2. ගපධප 3. නි̣ධ̣නි̣රි 4. රිගුරිම

07. ප̣ධ̣සරිස - , ප̣ධ̣සරිගරිස - , ... භූපාලි රාගයට අනුව මී ලඟට යෙදිය යුතු ස්වර බාණ්ඩය තෝරන්න.
1. ප̣ධ̣සරිසගමගරිස - 2.ප̣ධ̣සරිගරිගරිස- 3. ප̣ධ̣සරිගපගරිස- 4. ප̣ධ̣සරිගපමගරිස-

08. හෙරවී රාගය ආශ්‍රිතව නිර්මාණය වූ සරල ගීතයක් නොවේ.
1. එන්න මද නලේ 2. මධුර යාමේ 3. කවුරුදෝ අර කවුළුවෙන් 4. පාරමිතා බල

09. සර්ගම් ප්‍රබන්ධ සම්බන්ධව අදාල නොවන කරුණ තෝරන්න.
1. ස්වර වලින් පමණක් රචනා වී තිබීම. 3. රාගයේ ලක්ෂණ විස්තර කර තිබීම.
2. තාලානුකූලව රචනා වී තිබීම. 4. රාග සංගති යොදාගෙන තිබීම.

- **10 - 12 තෙක් ප්‍රශ්න සඳහා පහත සඳහන් වගුව ඇසුරු කර ගන්න.**

A	B	C	D
ධ ධි	ධිං තිං	ති නා	ගෙ ක


10. දයාවෙන් පමණක් වාදනය වන අවනද්ධ අක්ෂර අඩංගු වන්නේ,
    1. A 2. B 3. C 4. D
11. ජප් තාලයේ වාදනය වන අවනද්ධාක්ෂර යුගලයක් සඳහන් වන්නේ
    1. A හි ය 2. B හි ය 3. C හි ය 4. D හි ය
12. බයාවෙන් පමණක් වාදනය වන අවනද්ධාක්ෂර සඳහන් වන්නේ,
    1. A 2. B 3. C 4. D

- **ශ්‍රී ලංකාවේ පැවති රංග සම්ප්‍රදායන් හතරකට අයත් ගීත කිහිපයක් පහත වගුවේ දක්වා ඇත. ඒ ඇසුරෙන් 13 – 17 තෙක් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

	A	B	C	D
1	යානත අතුල මල් පෙති	සේ සුරිඳු	ලියමු මේ සිංහල	ගම්හිර කාලිංග නුවර
2	ලෝ පසිඳු	මෑ වේ මා දුටු කොමළ ලියා	රකිනු ඊෂ්වරා	මං වගෙ පේඩි කතක්
3	මෙමහින් ගිය රුසිරු එ තරුණා	රුසිරු ලඳුනි	දැක්කොත් පද්මාවතී	ගම්වල සැම තැන

13. ඉහත සඳහන් රංග සම්ප්‍රදායන් පිළිවෙලින් තෝරන්න.
    1. A නූර්ති B නාඩගම් C නව නාට්‍ය D කෝලම් 3. A නාඩගම් B නූර්ති C කෝළම් D නව නාට්‍ය
    2. A නාඩගම් B නව නාට්‍ය C නූර්ති D කෝලම් 4. A කෝළම් B නූර්ති C නාඩගම් D නව නාට්‍ය
14. මද්දලය හා තබ්ලාව ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩ ලෙස යොදා ගැණුනු නාට්‍ය සම්ප්‍රදායන්ට අයත් ගීත දැක්වෙන්නේ පිළිවෙලින්,
    1. A හා B 2. B හා C 3. A හා C 4. B හා D
15. D තීරුවේ සඳහන් ගීතයක් සඳහාවාදනයට සුදුසු තාල පදයක් දැක්වෙන පිළිතුර තෝරන්න..
    1. රන් තං කිට දින් තං 2. දොම් කිට කිට දොම් 3. ධගෙනති නකධින 4. ගුම් ගුද ගත
16. A කොටසේ 2 තීරුවේ සඳහන් ගීතය හා ගැළපෙන තවත් ගීතයක් සඳහන් වන්නේ,
    1. B – 1 2. C- 3 3. D -1 4. B – 3
17. විශ්වනාත් ලෙෂී , අබ්දුල් සතාර් ආදී සංගීතඥයින් හා සම්බන්ධයෙන් වූ රංග සම්ප්‍රදායට අයත් ගීත ඇතුළත් වන්නේ .
    1. A හි ය 2. B හි ය 3. C හි ය 4. D හි ය.
18. මොර / හි ඔ ටු / ද ම් / ප නා s /යන ගී පාදය
    1. සුළු තනි තිතට අයත් වේ. 3. සුළු මැදුම් දෙතිතට අයත් වේ.
    2. මැදුම් තනි තිතට අයත් වේ. 4. මැදුම් මහ දෙතිතට අයත් වේ.
19. රන් වන් පාටින් - සන් සුන් තාලෙන් යන ගී පාදය තුළ
    1. ලඝු පමණක්යෙදී ඇත. 3. ලඝු ගුරු මිශ්‍රව යෙදී ඇත.
    2. ගුරු පමණක්යෙදී ඇත. 4. ලඝු ගුරු ප්ලුත මිශ්‍රව යෙදී ඇත.
20. සංගීත ප්‍රසංගයකදී ශබ්දය අඩු වැඩි කිරීම සඳහා භාවිතා කරන උපකරණයකි.
    1. මික්සරය (Mixer) 3. ඇම්ප්ලිෆයරය (Amplifier)
    2. ස්පීකරය (Speaker) 4. මයික්‍රෆෝනය (Microphone)
21. කෙටි දොහොරාවක් (Adlib) සහිතව ගැයෙන ළමා ගීතය තෝරන්න.
    1. හිනැහේවී බෝනික්කා 3. මිදුලේ වැලි මාළිගවෙ
    2. ආදරේ ඇයි පොඩි හඳ මාමේ 4. කොටු වැටිච්ච පුංචි සරම

- **පහත සඳහන් සංගීතඥයන් ඇසුරෙන් 22 - 25 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A	B	C	D
			


22. ඉහත A B C D සංගීතඥයින් පිළිවෙළින් වන්නේ,
    1. ඩබ්.බී.මකුලොළුව , සී ද ඇස් කුලතිලක , ආනන්ද සමරකෝන් , සුනිල් සාන්ත
    2. සී ද ඇස් කුලතිලක , ඩබ්.බී.මකුලොළුව , සුනිල් සාන්ත , ආනන්ද සමරකෝන්
    3. ආනන්ද සමරකෝන් , සුනිල් සාන්ත , ඩබ්.බී.මකුලොළුව , සී ද ඇස් කුලතිලක.
    4. සුනිල් සාන්ත , සී ද ඇස් කුලතිලක , ආනන්ද සමරකෝන් , ඩබ්.බී.මකුලොළුව

23. ගුවන් විදුලි මුල් යුගයේ සරල ගී සඳහා විශේෂ දායකත්වයක් සැපයූ සංගීතඥයින් දෙදෙනා තෝරන්න.
    1. A හා B 2. B හා C 3. C හා D 4. B හා D

24. A අක්ෂරයෙන් දැක්වෙන සංගීතඥයා විසින් ලියන ලද " ජන සංගීත සිද්ධාන්ත " හා " ජන ගී ස්වර ප්‍රස්තාර " ඇතුළත් ග්‍රන්ථය වන්නේ,
    1. සංගීත සිද්ධාන්ත 2.අභිනව මූලික ගීත 3. හෙළ ගී මග 4. සිංහල ගැමි නාටකය

25. නෙළුම් ගී ඇසුරින් තනු නිර්මාණය කරමින් " දැතට වළලු මල් මුතුවැල් මාල පොටයි" ගීතයේ නිර්මාතෘවරයා,
    1. A 2. B 3. C 4. D

- **26 – 30 දක්වා ප්‍රශ්න සඳහා පහත දක්වා ඇති ස්වර පුවරුව උපයෝගී කර ගන්න.**



26. ඉහත ස්වර පුවරුවේ F Major Scale යට අයත් ස්වර වලට අදාල අංක සහිත පිළිතුර වනුයේ,
    1. 1 3 5 6 8 10 12 13 3. 3 5 7 8 10 11 12 13
    2. 8 10 12 13 15 17 18 20 4. 7 8 10 12 13 1 4 15 17

27. හෙරවී රාගයට අයත් විකෘති ස්වර දැක්වෙන ස්වරයන්ට හිමි අංක වන්නේ,
    1. 2 4 6 7 2. 4 6 7 8 3. 9 11 16 18 4. 7 8 10 12

28. අංක 1 , 5 , 8 අදාළ අංක වලින් දැක්වෙනුයේ,
    1. C Major Cord 2. F Major Cord 3. G Major Cord 4. F Minor Cord

29. ම̣ ප̣ ධ̣ නි̣ යන ස්වර වලට අයත් අංක සඳහන් වරණය වන්නේ,
    1. 8 , 10 , 12 , 13 2. 13 , 15 , 17 , 19 3. 1 , 3 , 5 , 7 4. 7 , 8 , 10 , 12

30. ඉහත ස්වර පුවරුවේ භූපාලි රාගයට අයත් ආරෝහණ ස්වර පිළිවෙලින් ,
    1. 3 , 5 , 7 , 8 , 10 , 12 3. 8 , 10 , 12 , 15 , 17 , 20
    2. 3 , 5 , 8 , 10 ,12 , 15 4. 8 , 10 , 12 , 13 , 15 , 17

- **31 - 34 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් ගී පද ඇසුරු කර ගන්න.**

අ) ඉපල්/ පිටින්/ගහන/අව්ව/පිටට/ඉහිර/වන්නේ/sss/

ඉ) තෙදැනි/රැදුරු/රැපුනො/දමැඩි/විපුල/විකුම්/නාsරා/sයන/

උ) අපසි/යඇස/ලෙසාs/sss/රැකවා/ඩුනොව/ලසාs/sss/

එ) +ඉරට/ඔබිය/ඉරමු/දු නේ s/+සිටි/යාss/sss/sss/

31. ඉහත ගී පද අතර සැදැස්මත් හා ගී මත් සමාන වන ගී පාදය තුමක්ද?
    1. අ 2. ඉ 3. උ 4. එ

32. මැදග පස්මත් යනි පිහිටන සුවිසිමත් පැදිය කුමක්ද?
    1. අ 2. ඉ 3. උ 4. එ

33. අවග්‍රහයෙන් ගැයෙන ගී පාදය තෝරන්න.
    1. අ 2. ඉ 3. උ 4. එ

34. නියති (යතිය නොයෙදෙන) පැදි ගනයට අයත් වන්නේ කුමන ගී පාදයද?
    1. අ 2. ඉ 3. උ 4. එ

35. කණ්ඩායම් ගීතයක් නොවන්නේ මින් කුමක්ද?
    1. කාගෙද ගොන් වස්සා 3. බැස සිතල ගහුලේ
    2. කලේ උකුලෙ තියාලා 4. මංගෝ කළු නැන්දේ

36. ගීතයේ තනුව ,රිද්මය ,Cords එකවර වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩයකි.
    1. සර්පිනාව 2. එකෝඩියන් 3. වයලීනය 4. වියොලාව

37. බටහිර සුෂිර වාදය භාණ්ඩ අතර Single Read වර්ගයට අයත් භාණ්ඩය මින් කුමක්ද?
    1. Trumpet (ට්‍රම්පට්) 2. Piccolo (පිකලෝ) 3. Saxophone (සැක්සෆෝන්) 4. Obo (ඕබෝ)

38. සේ ගීයක් සරල ගීතයක් වූ අවස්ථාවකි.
    1. කඳුළු හෙලා නෑඹිලියට 3. රන් මලක් ලෙස දෙව් බඹුන්
    2. රූ රැසේ අඳිනා ලෙසේ 4. ආදරයේ උල්පත වූ අම්මා

39. මහනුවර යුගයේ ඇති වූ සංගීතාංග දෙකකි.
    1. වන්නම් - ප්‍රශස්ති 3. සොකරි - කෝළම්
    2. ගැමි ගී - සේ ගී 4. නූර්ති - නාඩගම්

40. ස රි ග ග / ග - ග - / ම ග ම ග / ම ග රි - / යන ස්වර පාදය මධ්‍යමභාවයෙන් දැක්වෙන පිළිතුර තෝරන්න.
    1. රි ග ම ම / ම - ම - / ප ම ප ම / ප ම ම - /
    2. ම ප ධ ධ / ධ - ධ - / <u>නි</u> ධ <u>නි</u> ධ / <u>නි</u> ධ ප - /
    3. ග ම ප ප / ප - ප - / ධ ප ධ ප / ධ ප ම - /
    4. ප ධ නි නි / නි - නි - / ස් නි ස් නි / ස් නි ධ - /

PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙන් මාකාණක් කල්විත් තිණෙක්කලම්
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

ශ්‍රේණිය தரம் Grade	10 ශ්‍රේණිය	පෙරදිග සංගීතය - II	කාලය நேரம் Time: පැය 2 යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. 1. ස ව න / පි න න / ගී s ත / මී හි ර / යන ගීත පාදය සඳහා දාදරා තාලයේ ආවර්ත කීයක් වාදනය වේද?
2. ගාන සමය සඳහන් කිරිමේදී රාත්‍රී දෙවන ප්‍රහරය අයත් කාල සීමාව කුමක්ද ?
3. නිර්දේශිත රාග අතරින් සර්ව කාලීන රාගය තුමක්ද?
4. ..... ග්‍රන්ථයේ ඇතුලත් මනමත් කරවන දනමුළු දෙරනා ගීතය එහි මාත්‍රා සංඛ්‍යාව අනුව ..... පැදියකි.
5. ඕළු පිපිලා ගීතය ..... විසින් ගායනා කරනු ලබන අතර එය ..... පටිගත කරන ලද මුල්ම ගීතයයි.
6. 'බැති සිරිගර රස පිරී ' යනුවෙන් ලක්ෂණ ගීතය යෙදෙන්නේ කුමන රාගයේද?
7. බටහිර සංගීතයේ දී භාවිතා වන 5/4 තාලය හින්දුස්ථානි සංගීතයේදී ..... තාලය ලෙසද ..... තාලය ¾ ලෙසද ව්‍යවහාර කෙරේ.
8. ..... ගී , ගැමි ගී යටතේ එන සමාජ ගීයක් වන අතර ..... ගී අනාසාතාත්මක මෙහෙ ගීයක් වේ. (ලකුණු 12)

02. A නි ධ නි රි , ස , නි රි ග ප රි ස

B ධ නි ස රි ග , රි ස

C රි ග රි ම , ග රි ස

1. ඉහත සඳහන් A B C රාග පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 04)
2. ඉහත රාග අතරින් ඔබ කැමති රාගයක් තෝරා ගෙන එහි මධ්‍යලය ගීතයේ / වාදිතයේ ස්ථායි කොටස නියමිත තාල සහිතව ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)
3. (2) කොටස සඳහා ඔබ තෝරා ගත් රාගය හැර , ඉතිරි රාග දෙකෙන් එකකට අයත් සර්ගම් ගීතයක ස්ථායි කොටස නියමිත තාල සංඥා සහිතව ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

03. 1. පහත සඳහන් ගීත පාද සුදුසු පරිදි ප්‍රස්තාර කොට ඊට අයත් තාල පදය නම් කරන්න.
A සිහින සිතුවම් අතර සිරවී
B සුමදුර ගීතේ රාවය පැතිරේ
C සුදු පාට මල් පිරුණු - ගුරු පාර ලඟ හිඳින (ලකුණු 04)
2. A ගී පාදයට අයත් තාල පදය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)
3. එම තාල පදයට සමාන වන තිත නම් කර ඊට සමාන බෙර පදයක් තිත් සංඥා සහිතව ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04)

04. A - ඉහළ වෙලේ තියෙන බැතා
B - සදවා සුදු වැලි පිවිතුරු
C - වෙල් යායක ගොන් දෙන්නෙක්
D - බෝජ රාජ සම තේජබි රාමා
E - පැහැසරණිය මිණී පැමිණිය
F - කළු ගල් තලාලයි පාරට දමන්නේ
G - බුද්ධං සරණේ සිරස දරා ගෙන
H - යුද්දෙටත් ඇවිත් සිදු පිට

1. ඉහත සඳහන් ගීත පාද සේ ගී හා ගැමි ගී ලෙස බෙදා දක්වන්න. (ලකුණු 04)
2. ගැමි ගී හා සේ ගී අතර දක්නට ඇති විශේෂ ලක්ෂණ 2 බැගින් ලියා දක්වන්න. (ලකුණු 04)
3. ඉහත ගී පාද අතරින් අනාසාතාත්මක මෙහෙ ගී පාද තෝරා එම ගීත අනාසාතාත්මක වීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

05. .


A	B	C
ගුවන් විදුලි සරල ගී	සෝබාව දේ මෙපුර	එච්.ඩබ්.රූපසිංහ
ග්‍රැමෆෝන් ගී	රස ආහාර කවලා	සුනිල් සාන්ත
කපිරිඤ්ඤා ගී	ඕළු පිපිලා	ලූෂන් බුලත්සිංහල
නව නාට්‍ය ගී	අඩු කලේ සෙලවීම නිසා	එම්.එස්.ප්‍රනාන්දු

1. A තීරුවේ සඳහන් තොරතුරු වලට ගැලපෙන පරිදි B හා C තීරුවේ පේළි සකස් කරන්න. (ලකුණු 04)
2. කපිරිඤ්ඤා ගීත ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති වෙනත් සරල ගී දෙකක් නම් කරන්න. (ලකුණු 04)
3. ග්‍රැමෆෝන් තැටි යුගය පිළිබඳව ඔබ දන්නා කරුණු හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

06.



1. ඉහත ප්‍රස්තාරයේ 1 හා 2 සංකේත නම් කරන්න. (ලකුණු 02)
2. පහත දැක්වෙන සංකේත වල අදහස පැහැදිලි කරන්න.




(ලකුණු 04)

3. ඉහත බටහිර ප්‍රස්තාර පෙරදිග ක්‍රමයට අනුව නැවත ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

07. 1. ජන ගී නාද මාලා ඇසුරින් නිර්මාණ වූ සරල ගීත දෙකක් නම් කරන්න. (ලකුණු02)
2. දේශීය සංගීතයේ භාවිතා වන පංච තූර්ය භාණ්ඩ වර්ග නම් කර ඊට අයත් වාද්‍ය භාණ්ඩය බැගින් නම් කරන්න. (ලකුණු 05)
3. ඔබ උගත් නව නාට්‍ය ගීතයක් තෝරා ගෙන එම ගීතයට අදාළව පහත කරුණු සම්පූර්ණකරන්න
   නාට්‍යයේ නම
   නාට්‍ය නිෂ්පාදක
   සංගීතමය ලක්ෂණ තුනක් (ලකුණු 05)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

10 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට



Rs : 300




Rs : 300




Rs : 300



Rs : 300



Rs : 150



Rs : 150



Rs : 150




Rs : 150




Rs : 150




Rs : 200



Rs : 300



Rs : 350



Rs : 300




Rs : 300



Rs : 150



Rs : 200



Rs : 150



Rs : 300




Rs : 300




Rs : 300

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180



Rs : 180



Rs : 180



Rs : 180

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE